**IPRC/16/208**

# අනුරාධපුර යුගය ආරම්භයේ සිට පොළොන්නරු යුගය අවසානය දක්වා ක්‍රියාත්මක වූ චරපුරුෂ සේවය.

ප්‍රාර්තනා කරුණාරත්න[1*]

අතීතයේ සිට සෑම රාජ්‍යයක් ම රාජ්‍ය පාලනය ස්ථාවරව පවත්වා ගැනිම සඳහා චරපුරුෂ සේවාව යොදාගත් බවට සාධක හමුවේ. මෙම ලක්ෂණය ශ්‍රී ලංකාවේ රාජ්‍ය පාලනය ගොඩනැගීම සඳහා පොදු වූවක් නොව සෑම රාජ්‍යකටම විශේෂිත වූ පාලන අංශයක් ලෙස ක්‍රියාත්මක වූ අයුරු දක්නට ලැබේ. රාජ්‍ය නිලධාරීන් හා ඔවුන්ගේ රාජකාරීන් අතර චරපුරුෂයන් හා ඔවුන්ගේ සේවයන් රාජ්‍යතන්ත්‍රයේ ප්‍රවාහක බලවේගය වූ බව ඉතිහාසය පිරික්සීමේ දී පැහැදිලි වේ. මේ අනුව අනුරාධපුර රාජධානියෙන් ඇරඹුණු ලංකාවේ ස්ථාවර දේශපාලන ක්‍රියාවලිය තුළ චරපුරුෂ සේවාව අද දක්වාම ක්‍රියාත්මක වූවා දැයි පරීක්ෂා කිරීම මෙහි අරමුණවේ.

මේ සඳහා ප්‍රස්තුත කාල පරිච්ඡේදය වූ අනුරාධපුර යුගයේ සිට පොළොන්නරු රාජධානිය අවසානය දක්වා ලාංකීය පාලන තන්ත්‍රයේ ක්‍රියාත්මක වූ චරපුරුෂ සේවාව පිළිබඳ පර්යේෂණ සිදු කිරීම සඳහා ප්‍රාථමික හා ද්විතියික මූලාශ්‍රය භාවිතා කළ අතර මෙරට. චරපුරුෂයන් කෞටිල්‍ය අර්ථශාස්ත්‍රය වැනි මූලාශ්‍රයවල විවිධ නාම භාවිතා කරමින් හඳුන්වා ඇත්තේ, ගුඪ පුරුෂ, සත්ත්‍රින්, අපසර්ප හා චාර ආදී වශයෙනි. බොහෝ මූලාශ්‍රයවල මෙම රාජකාරියට ප්‍රමුඛතාවක් ලබා දී ඇත. කෞටිල්‍ය අර්ථශාස්ත්‍රයේ චරපුරුෂයාගේ ස්වරූපය, ඔවුන්ගේ ප්‍රභේද ඔවුන්ගෙන් අපේක්ෂිත සේවය හා රාජ්‍යතන්ත්‍ර විෂයෙහි ඔවුන්ගේ ක්‍රියාකාරීත්වය යන කරුණු විමසා බලයි. ලංකාවේ ක්‍රියාත්මක වූ චරපුරුෂ සේවය පිළිබඳ මූලාශ්‍රය අධ්‍යයනයේ දී මෙකී ලක්ෂණ සැලකිල්ලට ගන්නට ඇති බව සිතිය හැකිය.

දේශපාලනික ව්‍යාකූලත්වයක් ඇති වූ සෑම අවස්ථාවකදීම සතුරාගේ ඉදිරි කටයුතු පිළිබඳ තොරතුරු සපයා ගැනීම සඳහා බොහෝ අවස්ථාවල චරපුරුෂයන් විවිධ වෙස්ගෙන අවශ්‍ය තොරතුරු සපයා දී ඇත. අනුරාධපුර යුගයේ දී චරපුරුෂ සේවය වඩාත් කැපීපෙනෙන ලෙස යොදා ගත්තේ කාවන්තිස්ස හා දුටුගැමුණු රාජ්‍ය කාලවල දී බව පැහැදිලි වේ. පොළොන්නරු යුගයේ දී බාහිර හා අභ්‍යන්තර වශයෙන් පැවති දේශපාලන ව්‍යාකූලත්වයන් හේතුවෙන් බොහෝ පාලකයන් චරපුරුෂයන් යොදාගත්ත ද මේ අතර කැපී පෙනෙන්නේ, ☛ වන පරාක්‍රමබාහු රජුය. මේ අනුව රාජ්‍ය පාලනය ගෙනයාමේ දී ඇතිවූ දේශපාලන ව්‍යාකූලත්වය හමුවේ චරපුරුෂ සේවය වඩාත් ප්‍රයෝජනවත් වූ බව මින් නිගමනය කළ හැකිය.

***ප්‍රමුඛ පද :-*** *අනුරාධපුර, පොළොන්නරු, චරපුරුෂ සේවාව, කෞටිල්‍ය අර්ථශාස්ත්‍රය, ශ්‍රී ලංකාව*

[1] කැලණිය විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකාව *sumuduprarthana92@gmail.com